# තේ තතු

දෙවන කලාපය

ISSN - 1391-6785

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ප්‍රකාශණයකි

පළවෙනි කාණ්ඩය, දෙවෙනි කලාපය 2001 ජූලි - දෙසැම්බර්


## වැඩි අස්වැන්නකට පොඩි ඔවදනක්

"කොපමණ පොහොර දැම්මත් අස්වැන්න අඩුයි" මෙය කුඩා තේ වතු හිමියන් බොහෝ දෙනෙකු කියන කතාවක්. තේ වගාවක අස්වැන්න අඩු වෙන්න හේතු ගණනාවක් තියෙනව.

ඔබේ ඉඩමේ පසේ ආම්ලිකතාවය නිසි මට්ටමක පවත්වා ගැනීම වැදගත්. පසේ ආම්ලිකතාවය මනින්නෙ පී.එච් අගයෙන්. පී.එච් අගය 4.5 – 5.5 ත් අතරේ තිබෙනවිට යොදන පොහොර වලින් හොඳ ප්‍රතිඵල ලබා ගන්න පුළුවන්. එහෙත් තේ වගාවට නයිට්‍රජන් අඩංගු පොහොර යොදනවිට පසේ පී.එච් අගය අඩු වෙනව. (ආම්ලික ගතිය වැඩිවෙනවා.) එය නිසි පරාසයක රඳවා ගන්න, පස් පරීක්ෂා කරල කප්පාදුවකට වරක් නිර්දේශිත ප්‍රමාණයට ඩොලමයිට් යොදන්න ඕනි.



මෙවැනි මුඩිච්චි ඉවත් කරන්න

තේ වගාවක අස්වැන්නට කෙලින්ම බලපාන විද්‍යාත්මක කරුණු කිහිපයක් තිබෙනවා. ඒවා නම් දල්ලක බර, පඳුරක තිබෙ[illegible] ගණන හා නිරෝගී පැල ගණන.

ක්ලෝනය අනුවත් කප්පාදුවෙන් පසුව වයස අනුවත් දල්ලක බර වෙනස් වෙන්න පුළුවන්. දළු නෙලන තලයේ ඇති විවිධ වයස් කාණ්ඩවල දළු අතරින් අප නෙලා ගත යුත්තේ නිසි පමණට මේරූ දළු විතරයි. අරිම්බු කිසිවිටකවත් නෙලන්න හොඳ නෑ.



හොඳින් දළු ඇදුනු දළු තලයක්.

පඳුරක තිබෙන දළු අංකුර සංඛ්‍යාව වැඩි කර ගන්න නම් පඳුරේ වපසරිය වැඩිකර ගන්න ඕනේ. ඒ සඳහා තවානේ ඉදලම තේ පැලය අතු විහිදුනු පඳුරක් ලෙස සකස් කර ගතයුතුයි. නිසිකලට තේ ඉඩමෙන් ලැබෙන අස්වැන්න අනුව පොහොර යෙදීමෙනුත්, ඉන් සතියකට පමණ පසු සින්ක් සල්ෆේට් ඉසීමෙනුත් දළු ගණන වැඩි කරගැනීමට පුළුවන්. ඔබේ තේ කැල්ලේ නිසි අයුරින් දළු නොකැඩීම නිසා ඉපල් ගැහුණු අතු (මුඩිච්චි) හැදිල ඇති. මේවා තියෙනකම් එතනින් අලුත් දළු ඇදෙන්නේ නැහැ. ඒ නිසා මේවා ඉවත් කරන්න වෙනව. ඒ වගෙම වංගි දළු ඉවත් කිරීමත් නිසි කලට කප්පාදු කිරීමත් ඉතා වැදගත්.

ඔබේ ඉඩමේ නියමිත ප්‍රමාණයට තේ පඳුරු තිබීමත් අවශ්‍යයයි. නියමිත ප්‍රමාණයට තිබුනත් ඒවා කොපමණ ප්‍රමාණයක් නිරෝගීද යන්න තමයි වැදගත්. රෝග හා කෘමි උවදුරු වලට ගොදුරු වුණ පඳුරුවල අස්වැන්න අඩු වෙන එක සාමාන්‍ය දෙයක්. මේවාට නිසි ප්‍රතිකාර කල යුතුයි. සමහර විට ඒ වෙනුවට අලුතින් පැල සිටුවීමටත් සිදුවේවි.

මේතාක් අප සොයා බැලුවේ වැඩි වියදමක් නැතිව තේ ඉඩමට කරන්න පුළුවන් සත්කාර කිහිපයක්. මීට අමතරව අස්වැන්න සතිපතා ගණනය කර වාර්තා තබා ගැනීමත් වැදගත්. මේ පිළිවෙත් අනුගමනය කළොත් ඔබේ ඉඩමෙනුත් වැඩි අස්වැන්නක් ලබා ගත හැකිවේවි.


පී. ජී. එන්. මහින්ද